දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2369302, 011-2369305
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: sec-psc@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය**

**அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்**

**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
**No. 177, Nawala Road, Narahenpita, Colombo 05.**

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/02-01-05/01/201·

ඔබේ අංකය / உமது இல. / Your No.: [illegible]/05/12/01/104

දිනය / திகதி / Date: 2014- 07- 14

ලේකම්

ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය

<u>රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ බඳවා ගැනීමේ පරිපාටි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව සකස් කිරීම - රූ රටා සංස්කාරක තනතුර (කොන්ත්‍රාත් පදනම මත)</u>

උක්ත කරුණට අදාළව ඔබේ සමාංක හා 2014-06-20 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුත් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙහි රූ රටා සංස්කාරක තනතුර (කොන්ත්‍රාත් පදනම මත) සඳහා වන බඳවා ගැනීම් පරිපාටියේ මුල් පිටපත මේ සමඟ එවමි.

03. මෙම බඳවා ගැනීම් පරිපාටිය පිළිබඳ අදාළ නිලධාරින් දැනුවත් කරන ලෙසත්, අදාළ බඳවා ගැනීමේ පරිපාටිය වෙබ් අඩවියේ පළ කරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

ඩබ්ලිව්. බී. පී. සිල්වා
සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත්: 1) රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව (මුල් පිටපත මේ සමඟ එවමි).
2) ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව (මුල් පිටපත මේ සමඟ එවමි).
3) ආයතන අධ්‍යක්ෂ ජනරාල් (මුල් පිටපත මේ සමඟ එවමි).

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශයේ රූ රටා සංස්කාරක තනතුර සඳහා (කොන්ත්‍රාත් පදනම මත) බඳවා ගැනීමේ පරිපාටිය

**01. සම්බන්ධ වන ආයතන**

| | | | |
|---|---|---|---|
| 1.1 | දෙපාර්තමේන්තුව රජයේ ප්‍රවෘත්ති | යොමු අංකය : රප්‍ර/ආ01/11/(IV වෙළුම) | දිනය: 2013.09.20 |
| 1.2 | අමාත්‍යාංශය ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති | යොමු අංකය : එම්එම්අයි/05/12/01/104 | දිනය: 2013.10.09 |
| 1.3 | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම | යොමු අංකය : DMS/C/6/44/01-(Vol-III) | දිනය: 2013.09.03 |
| 1.4 | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය | යොමු අංකය : EST-2/RECRU/04/3060 | දිනය: 2013.12.31 |
| 1.5 | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය : NSCC/6/5/093/SR-III | දිනය: 2013.10.30 |
| 1.6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය | යොමු අංකය : PSC/EST/02-01-05/01/2014 | දිනය: 2014.05.08 |

**02. පත් කිරීම් බලධරයා පිළිබඳ විස්තර**

**2.1 කොන්ත්‍රාත් පදනම මත පත් කිරීම් බලධරයා :** රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

**03. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :**

රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්ගේ අධීක්ෂණය හා උපදෙස් අනුව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන කාර්යාංශය මඟින් පළ කරනු ලබන ප්‍රකාශනයන්හි රූ රටා සංස්කරණය කිරීමේ කටයුතු

**04. තනතුරෙහි/තනතුරුවල ස්වභාවය :**

මෙම තනතුර තාවකාලිකය. ස්ථිර පත්වීමක් ලබා ගැනීමට හෝ ස්ථිර නිලධාරීන්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකමක් නොමැති කොන්ත්‍රාත් පදනම මත වූ තනතුරකි.

**05. මාසික දීමනාව :** රු 25,000/-

**06.** කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අනුමත තනතුරු හා තනතුරු සංඛ්‍යාව

**6.1** අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :-

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| රූ රටා සංස්කාරක | 01 | 1. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන කාර්යාංශය මඟින් නිකුත් කරනු ලබන ප්‍රකාශනයන්හි රූ රටා සංස්කරණය කිරීම.<br>2. ඉහත රාජකාරියට අමතරව රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන වෙනත් රාජකාරි ඉටු කිරීම. |

**6.2.** ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : රූ රටා සංස්කාරක 01

**07.** **කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම:**

**7.1 සුදුසුකම්**

**7.1.1 අධ්‍යාපන සුදුසුකම් :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් උපාධියක් ලබා තිබීම.

**7.1.2 වෘත්තීය සුදුසුකම් :**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් රූ රටා සංස්කරණය හෝ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්ව තිබීම.

**7.1.3 පළපුරුද්ද :**

රජයේ ලියාපදිංචි ප්‍රකාශන ආයතනයක තනතුරට අදාළව රූ රටා සංස්කරණ කටයුතු සම්බන්ධයෙන් අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම.

**7.1.4 කායික සුදුසුකම් :** සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් මෙම තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**7.1.5 වෙනත් සුදුසුකම් :**

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.1 හා 7.2 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2. වයස :

අවම සීමාව : අවුරුදු 18

උපරිම සීමාව : අවුරුදු 55

7.3 බඳවා ගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් උපරිම ලකුණු ලබාගත් අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතරින් තනතුර සඳහා බඳවාගනු ලැබේ.

| පරීක්ෂා කර ලකුණු ලබා දෙන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 40 | අදාළ නොවේ |
| 2. අතිරේක වෘත්තීය සුදුසුකම් | 25 | |
| 3. අතිරේක වෘත්තීය පළපුරුද්ද | 30 | |
| 4. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

සටහන - ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයක් ඇතුළත, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටිය අනුමත කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදුකරනු ඇත.

7.3.1.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා: රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

7.4 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

08. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාලවේ.

09. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ :

අත්සන :

නම : පී.ජී.එන්. කුමාරි

තනතුර : සහකාර ප්‍රවෘත්ති අධ්‍යක්ෂ

දිනය : 2014/05/22

පරීක්ෂා කළේ :

අත්සන :

නම : එස්.ජී.එල්. සමරසේකර

තනතුර : සහකාර ප්‍රවෘත්ති අධ්‍යක්ෂ

දිනය : 2014/05/22

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : මහාචාර්ය ආරියරත්න ඇතුගල

තනතුර : රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

නිල මුද්‍රාව : මහාචාර්ය ආරියරත්න ඇතුගල
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

දිනය : 2014/05/31

---

යොමු අංකය : MMI/05/12/01/104

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ රූ රටා සංස්කාරක තනතුර සඳහා වන බඳවා ගැනීම පරිපාටිය (කොන්ත්‍රාත් පදනම මත) අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන :

නම : චරිත හේරත්

ලේකම්

ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය

දිනය : 13.6.14

නිල මුද්‍රාව :

---

යොමු අංකය : PSC/EST/02-01-05/01/2014

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ හි ප්‍රකාශන අංශයේ රූ රටා සංස්කාරක තනතුර (කොන්ත්‍රාත් පදනම මත) සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2014.03.08 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන :

නම :

ලේකම්,

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 14 07 2014

නිල මුද්‍රාව :



ටී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංකය. 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ-05.